# විපක්ෂයේ ප්‍රචාරක රැලි නැති තරම්

## ක්‍රීඩා පිටි මෙදා පාළුවට ගිහින්

## පැෆ්රල් විධායක අධ්‍යක්ෂ

**රවිශාන් ප්‍රනාන්දු**

විපක්ෂයේ දේශපාලන රැස්වීම් බොහෝ සෙයින් අඩු බවක් මෙවර මහ මැතිවරණයේදී නිරීක්ෂණය වන බව පැෆ්රල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'ඉරිදා මව්බිම'ට පැවැසීය.

මෙ වන විට ප්‍රධාන රැලි දක්නට ලැබෙන්නේ ආණ්ඩු පක්ෂයේ පමණක් බව හෙට්ටිආරච්චි මහතා පැවැසීය.

විපක්ෂයේ පක්ෂවලට ප්‍රචාරක රැලි සහ තරගකාරී ප්‍රචාරණ යාන්ත්‍රණයක් නොමැති වීම ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය තුළ ගැටලු සහගත බව 'පැෆ්රල්' විධායක අධ්‍යක්ෂවරයා අවධාරණය කළේය.

මේ අතර කොළඹ මහ නගර සභාවේ ක්‍රීඩා පිටි මෙවර දේශපාලන රැස්වීම් සඳහා ඉල්ලීමේ ලොකු තරගයක් නොමැති බව එම නගර සභාවේ නාගරික කොමසාරිස් භද්‍රානි ජයවර්ධන මහත්මිය ද පැවැසුවාය.

මේ වන විට කොළඹ නගර සභා සීමාවේ ඇති එක් ක්‍රීඩා පිටියක් පමණක් දේශපාලන පක්ෂයක් ඉල්ලා ඇති බවත් වෙනදා මෙන් දේශපාලන රැස්වීම් සඳහා ක්‍රීඩා පිටි ඉල්ලා සිටීමේ තරගයක් නොමැති බවත් කොමසාරිස්වරිය කීවාය.

මහ මැතිවරණයේ අවසන් ප්‍රචාරක රැලි හතරක්වත් නගර සභා සීමාවේ ක්‍රීඩා පිටිවල පැවැත්වෙනු ඇතැයි තමා විශ්වාස කරන බවද ජයවර්ධන මහත්මිය වැඩිදුරටත් සඳහන් කළාය.